**කොච්චිකඩේ පාළම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය - 2019**

**-----------------------------------------------------------------------**

කොච්චිකඩේ පාළම ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යුහාත්මකව දුර්වල සහ වර්තමානයේ රථවාහන පරිමාවට හා වාහන බරට යෝග්‍ය නොවන කොච්චිකඩේ පාළම ප්‍රතිසංස්කරණය කිරීම සහ පැළියගොඩ සහ පුත්තලම හා සම්බන්ධ කරන මාර්ග යටිතල පහසුකම් පවත්වා ගැනීම සඳහා සැලකිය යුතු සහයක් ලබාදීම ව්‍යාපෘතියේ අරමුණුවේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,735.62 කට සමාන යුරෝ මිලියන 10.85 ක් වන අතර ඉන් රු.මිලියන 1,392 කට සමාන යුරෝ මිලියන 8.70 ක් Raiffeisen Bank International AG of Austria විසින් ලබාදීමට එකඟ වීතිබුණි. ව්‍යාපෘතියේ එහි කටයුතු 2016 ජුලි 24 දින ආරම්භ කරන ලද අතර 2019 ජනවාරි 24 දින වන විට නිමකිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. භෞතික කාර්යසාධනය
## 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

පාලමේ ඉදිකිරීම් කටයුතු 2016 ජූලි 24 දින ආරම්භ කර 2019 ජනවාරි 24 දින සැලසුම් කල දිනයට පෙර 2018 දෙසැම්බර් 23 දින කටයුතු නිමකර මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී ඇත.

## 2.2 ඉඩම් අත්පත් කර ගැනීම පිළිබ ගැටළු

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ලැබී තිබුණු තොරතුරු අනුව, කොච්චිකඩේ පාලම ප්‍රතිසංකරණය කිරීම සඳහා ඉඩම් කොටස් 9 ක් අත්කර ගැනීමට සැලසුම් කර තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට වන්දි මුදල් රු.මිලියන 115.33 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්කර ගැනීමේ පනතේ 44 වන වගන්තිය යටතේ ඉඩම් කොටස් 06 ක් පමණක් ලියාපදිංචි කර තිබුණි. | වන්දි පිරිවැය සහ ඒ මත පොළී ගෙවීම් වැඩිවීමට ඉඩ ඇත. | එකග වේ. | මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ඉඩම්වල අයිතිය මාරු කිරීමට කඩිනම් පියවර ගත යුතු වේ. |

## 2.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| ව්‍යාපෘතියේ කටයුතු අවසන් කර 2018 දෙසැම්බර් 23 දින මාර්ග සංවර්ධන අධිකාරිය වෙත භාරදී තිබුණද, මාර්ග සංවර්ධන අධිකාරියේ නොවන කාර්ය මණ්ඩලය සඳහා වැටුප්, අතිකාල සහ ගමන් වියදම් ව්‍යාපෘති දීමනා සහ නිවාඩු දින දීමනා යනාදි ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ වියදම් සාධාරණ හේතුවකින් තොරව පසුගිය වර්ෂයේ වියදම්වලට සාපේක්ෂව 2019 වර්ෂයේදී පිළිවෙලින් සියයට 67 සියයට 63 සියයට 10 සහ සියයට 4 කින් වැඩි වී තිබුණි. | ව්‍යාපෘතියේ පිරිවැය ඉහළයාමට ඉඩ ඇත. | ව්‍යාපෘතියේ අවසාන ගෙවීම 2019 දී සිදු කරන ලද අතර ව්‍යාපෘති කළමනාකරණ එකකයේ පොදු කාර්ය පිරිවැය වර්ෂයේ ප්‍රතිපාදන තුල සිදු කර ඇත. | ව්‍යාපෘතියේ පිරිවැය පාලනය කිරීමට පියවර ගත යුතුය. |